# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1489/2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 29/11/2023<br>පැය 1145 |

## මාධ්‍ය නිවේදනය

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

### 01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර

2023.11.29 වන දින අළුයම් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැලිවේරිය පොලිස් වසමේ වැලිවේරිය ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 16 මිලි ග්‍රෑම් 880 ක්, එම ජාවාරමෙන් උපයා ගන්නා ලද බවට සැකකරන මුදල් 6,070/-ක් හා ඩිජිටල් තරාදියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන වැලිවේරිය පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන කැලණිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. වැලිවේරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. බලපත්‍ර නොමැතිව ටිපර් රථ වලින් පස් ප්‍රවාහනය කරන ලද සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා දෙනියාය කඳවුර

2023.11.29 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා දෙනියාය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත අකුරැස්ස පොලිස් වසමේ විල්පිට ප්‍රදේශයේ දී වැටලීම් 02 ක් සිදු කර **බලපත්‍ර නොමැතිව ටිපර් රථ 02 කින් පස් ප්‍රවාහනය කල සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන අකුරැස්ස** පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 44 හා 48 වයස් වල පසුවන අකුරැස්ස, උයන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ. අකුරැස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 03. ගංජා හා හැෂ් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අම්පාර කඳවුර

2023.11.29 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අම්පාර කඳවුර නිලධාරීන්ට ලද තොරතුරක් මත අම්පාර පොලිස් වසමේ අම්පාර ප්‍රදේශයේ

දී වැටලීමක් සිදු කර **ගංජා කිලෝ 01 ග්‍රෑම් 05 හා හැෂ් ග්‍රෑම් 01 මිලි ග්‍රෑම් 680 ක් සමඟ සැකකරුවකු** අත්අඩංගුවට ගෙන අම්පාර පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන උහන ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** අම්පාර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා තිරුක්කෝවිල් කඳවුර.**

2023.11.29 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා තිරුක්කෝවිල් කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත අක්කපත්තුව පොලිස් වසමේ මොට්ටයාමලෙ ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සමඟ සැකකරුවකු** අත්අඩංගුවට ගෙන අක්කරපත්තුව පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වූ අක්කරපත්තුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. අක්කරපත්තුව පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. මත් කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වාලච්චේන කඳවුර.**

2023.11.29 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා වාලච්චේන කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වාලච්චේන පොලිස් වසමේ බිරන්දරච්චේන ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **මත් කරල් 2500 ක් සන්තකයේ තබාගෙන මෝටර් රථයකින් ගමන් කරමින් සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන සඳහා වාලච්චේන පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වූ මඩකලපුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** වාලච්චේන පොලිසියි වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**06. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර**

2023.11.29 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර නිලධාරීන්ට ලද තොරතුරක් මත මිනුවන්ගොඩ පොලිස් වසමේ අඹගහවත්ත ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර නීති විරෝධී මත්පැන් ලීටර් 33 **ක් සමඟ සැකකරුවකු** අත්අඩංගුවට ගෙන මිනුවන්ගොඩ පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වූ කොටුගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** මිනුවන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**